# පොලිසියට වසර 156යි



**ශ්‍රී ලංකාවේ 156 වැනි පොලිස් දිනය අදට (3) යෙදේ මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

ශ්‍රී ලංකාවේ පොලිසිය පිළිබඳ ඉතිහාසය ශතවර්ෂ දෙකකට වඩා පැරණිය. ප්‍රථම පොලිස්පති ලෙස ශ්‍රීමත් ජී.ඩබ්.ආර්. කැම්බල් පොලිස්පති ධූරයට පත්වූයේ 1866 සැප්තැම්බර් 03 වන වැනිදය.

ලන්දේසි ජාතිකයින් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් අනතුරුව 1650 ජූනි මස 10 දින කොළඹ නගර සභාව සම්මත කරගත් යෝජනාවක් අනුව කොළඹ නගරයේ වෙළඳම් කටයුතු පාලනය කිරීම සඳහාත්, රාත්‍රි කාලයේ නගර ආරක්ෂාව සඳහාත් සොල්දාදුවන් සිව් දෙනෙකු යෙදවීම ලංකාවේ පොලිස් රාජකාරියේ මූලාරම්භය ලෙසට ඇතැම් මූලාශ්‍රයන්ගෙන් පිළිබිඹුවේ.

1806 වර්ෂය වන විට ඉංග්‍රීසි ජාතිකයින් කොළඹ නගරයෙන් පිටත පොලිස් රාජකාරී කිරීම සඳහා ආඥා පනතක් සම්මත කරගෙන ඇති අතර 1833 වන විට රජයෙන් ගෙවීමක් කරන පොලිස් සේවයක් ආරම්භ වී ඇත.

1843 දී එවකට බල පැවැත්වූ පොලිස් ආඥාපනත අවලංගුකර දිවයිනේ ඕනෑම නගරයක පොලිස් ස්ථාන පිහිටුවීමට ආණ්ඩුකාරවරයාට බලය පවරන ලදී. 1843 වර්ෂයේදී පොලිස් පරීක්ෂක නිලය හඳුන්වා දෙමින් නිලධාරීන් සංඛ්‍යාව වැඩිකර ඇති අතර පොලිස් පියන් තනතුර අවලංගුකර පොලිස් කොස්තාපල් තනතුරද හඳුන්වා දී ඇත. 1863 වර්ෂයේ අවසානය වන විට පොලිස් ස්ථාන 48 ක් පිහිටුවා තිබී ඇති අතර 1867 වන විට පොලිස් මූලස්ථානය මරදානේ මුස්ලිම් පල්ලිය අසල පිහිටුවා ඇත. ප්‍රථම ශ්‍රී ලාංකික පොලිස්පති ලෙස සර් රිචඩ් අලුවිහාරේ මහතා පත්වන්නේ නිදහස ලැබීමටත් පෙර 1947 වර්ෂයේදීය. ඔහු මෙරට 11 වන පොලිස්පතිවරයාය.

1948 වර්ෂයේ නිදහස ලැබීමෙන් පසු මෙරට ඇති වූ සමාජ, ආර්ථික, දේශපාලනමය වෙනස්වීම්වලට සරිලන ලෙස විකල පොලිස් දෙපාර්තමේන්තුවද වෙනස් වෙමින් දිවයින පුරා පොලිස් ස්ථාන වැඩි සංඛ්‍යාවක් ආරම්භ කර විවිධ රාජකාරී ආරම්භ කර ඇත.

2016 වර්ෂය වන විට ලංකාවේ පොලිස් ස්ථාන 438 ක් ක්‍රියාකාරීව තිබූ අතර එවකට රාජකාරි කළ පොලිස් නිලධරයන් සංඛ්‍යාව පොලිස් විශේෂ කාර්ය බළකායද ඇතුළත්ව 86830 කි. 2016 වර්ෂයේ රාජ්‍ය ප්‍රතිපත්ති අනුව පොලිස් ස්ථාන 600 දක්වා වැඩි කිරීමටත්, ප්‍රජාපොලිස් සේවාවන් ආරම්භ කිරීමටත් තීරණය විය. ඒ අනුව පොලිස් ස්ථාන 494 ක් දක්වා වැඩි කර ගැනීමට හැකි විය.

2019 වර්ෂයේ "සෞභාග්‍ය දැක්ම" ප්‍රතිපත්ති අනුව අලුතින් පොලිස් ස්ථාන 201 ක් වැඩිකිරීමට යෝජනා විය. ඒ අනුව පොලිස් ස්ථාන 695 දක්වා වැඩිවීමට නියමිතව තිබුණි. එම සංඛ්‍යාවෙන් මේ වන විට නව පොලිස් ස්ථාන 111 ක් විවෘත වී අවසන් වූ අතර අද වන විට දිවයින පුරා පොලිස් ස්ථාන 605ක් ක්‍රියාත්මක වේ.

156 වන පොලිස් දිනය සමරන අවස්ථාව වන විට ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන් සංඛ්‍යාව 86698 කි. මීට අමතරව පොලිස් විශේෂ කාර්ය බළකා නිලධරයන් 8326ක් ද පොලිස් සහායක සේවා නිලධරයන් (වැඩ අංශය) 1307 ක් ද පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන් (එස්.ඒ) 232 ක්ද වන ලෙස සමස්ත පොලිස් සේවයේ 96563 ක් රාජකාරි කරණු ලබති.

වත්මන් පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න පොලිසිය ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතියක් හඳුන්වාදී එය මේ වන විට ක්‍රියාත්මකව ඇත. ඒ අනුව පොලිස් පරිපාලනයේ නව ව්‍යුහයක් හඳුන්වාදී ඇත. නව ව්‍යුහයට අනුව ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස 45 ක් හා ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස 77 ක් ලෙසත් පොලිස් සේවය සඳහා අවශ්‍ය නිලධරයින් ගණන 107000 ක් ලෙසද සංශෝධනය විය.

2022 අගෝස්තු 01 වනවිට රාජකාරි කරන පොලිස් නිලධරයින් සංඛ්‍යාව 96563 ක් පමණ වේ.

ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන් සමානාත්මතාවයෙන් සලකා කාන්තා පොලිස් නිලධාරිනියන්ටත් පොලිස් ස්ථානාධිපති තනතුරු, කොට්ඨාසභාර හා දිසාභාර නිලධාරිනියන්වීමේ අවස්ථාවන් ලබාදීම මෙන්ම ඉතිහාසයේ ප්‍රථම වතාවට කාන්තා නියෝජ්‍ය පොලිස්පති වරියන් 04 දෙනෙකු පත්කර පොලිස්පති තනතුර දක්වා යාමට හැකි අවස්ථාවන් සලසා දීම කැපී පෙනේ.

මෑත ඉතිහාසයේ ආරම්භ කළ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය (SOCO) හා 119 පොලිස් ක්ෂණික අමතුම් සේවය, සහන මැදිරිය, කාලීනව පොලිස් රාජකාරීන් ඉටුවන ඉතා වැදගත් සේවාවන් වේ.

අපරාධකරුවන් හඳුනා ගැනීම සහ සමස්ත අපරාධ විමර්ශනය සඳහා CCTV පද්ධතිය සහ CCTV සහිත ජංගම රථ භාවිතා කිරීමත් අපරාධ වාර්තා කොට්ඨාසයෙන් වීඩියෝ පටිගත කිරීම මෙන්ම මාධ්‍ය කොට්ඨාසයෙන් පැය 24 පුරාවට රූපවාහිනී නාලිකා, වෙබ්, සාමජමාධ්‍ය ජාලා ආවරණය වන පරිදි මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය නිරීක්ෂණ මැදිරියක් පවත්වාගෙන යාම වැදගත් වේ.

පොලිසිය අප හඳුනා ගන්නේ නව අපරාධ යුක්ති පද්ධතිය යටතේ එන එක් ආයතනයක් වශයෙනි. අධිකරණය, බන්ධනාගාරය, පරිවාසය ආදී ඊට අනුබද්ධ තවත් ආයතන විය. සමාජය විසින් වැරදි සිදුකරන තාක්කල් පොලිසියක අවශ්‍යතාව ජනතාවටම වඩාත් දැනෙනු ඇත. සියලුම නීති රීතිවලට ගරුකරන යහපත් ක්‍රියාවන්හි යෙදෙන මිනිසුන් වෙසෙන පොලිස් වසමක් තිබේ නම් එහි පොලිසිය ඉවත්කර වෙනත් ගමකට හෝ සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ශ්‍රම හමුදාවක් බවට පත්කළ හැකිය. එය රඳාපවතින්නේ පොලිසියත් ජනතාවත් කියා වෙන්කරගත් සමාජයක නොව අප සියල්ලම සාමාජිකයින් යැයි සිතන හෝ මිහිබට මිනිසුන් ලෙස සැමට සමානව සිතමින් අනෙකාට ගරු කරන අනෙකාත් ජීවත්විය යුතුයැයි හැඟීමකින් සිතන නිදහස් නිවහල් දිනකය.

සැම දින සැමවිට සැම දෙනාගේ යහපත වෙනුවෙන් ක්‍රියා කරන පොලිස් නිලධරයකුගේ පරම පැතුම වන්නේ උදාවන දිනක මහජනතාවගේ තෙලිතුඩින් හා මුවඟින් පොලිස් සේවය වෙනුවෙන් ස්වර්ණමය වදන් හා ආශිර්වාදත්මක වදන් එකතුවනු දැකීමය'

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**